# ශ්‍රී ලංකාවේ වමේ කතාව



බුල්ජන්ස්

ජනතාවගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීම යන කරුණට අනුව බලන විට මෙරට ඉතිහාසයේ, එම තත්වය කැපී පෙනෙන ලෙස දක්නට ලැබෙන්නේ දහනව වන සියවසේ අග භාගයේ සිටය. ශ්‍රී ලංකාවේ ප්‍රථම වාමාංශික පක්ෂය මෙන්ම ප්‍රථම දේශපාලන පක්ෂය වන ලංකා සමසමාජ පක්ෂය බිහි වීමට අඩ සියවසකට පමණ පෙර සිටම පොදු ජනතාවගෙ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීම, ඒ සම්බන්ධයෙන් සංවිධානය වීම පිළිබඳ පැහැදිළි තොරතුරු අපට හමුවේ. අප රට සම්බන්ධයෙන් ගත්විට රටේ ජන විඥාණය වෙනස් කරමින්, එයට බලපෑම් කරමින් මෙන්ම මෙරට පාලනය ගෙන ගිය බ්‍රිතාන්‍ය පාලනය අභියෝගයට ලක් කරමින් මහජනතාවගේ අයිතීන් වෙනුවෙන් නැගී සිටි බලවේගයන් ප්‍රධාන ධාරාවන් තුනක් ලෙස දක්නට ලැබේ. එක් අතකින් බෞද්ධාගමික පුනර්ජීවනය වෙනුවෙන් පෙනී සිටි හා උද්ඝෝෂණය කළ පිරිස් ද, බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි වූ දේශීය අනන්‍යතාව වෙනුවෙන් පෙනී සිටි ජාතිකවාදී කොටස් ද, කම්කරු පංතිය අතර කටයුතු කළ වෘත්තිය සමිති ගොඩ නඟන්නට ඉදිරිපත් වූ කොටස් ද වශයෙන් මෙම ධාරාවන් වර්ගීකරණය කරන්නට පුළුවන. මෙම කණ්ඩායම් සියල්ලම ජනතාවගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීමට ඉදිරිපත් වූවාය යන්න සත්‍යයක් වුවත් රටේ වාමාංශික ව්‍යාපාරය බිහි වීමට පදනම සැකසූ බලවේගය වශයෙන් විශාලම කාර්යභාරයක් ඉටු කරන ලද්දේ වෘත්තීය සමිතිවාදීන් විසිනි.



ලිස්බෝ පින්තු

බෞද්ධාගමික පුනර්ජීවනය හා සිංහල ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි බලවේග මෙන්ම, බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව පෙනී සිටි බලවේග බොහෝ විට එකම කණ්ඩායමක් ලෙස කටයුතු කරනු දක්නට ලැබිණ. මෙම බලවේග යම්කිසි බලපෑමක් මෙන්ම සේවාවක් කළාය යන්න සත්‍යයක්ම වුවත්, ඔවුන්ට බ්‍රිතාන්‍ය පාලනයෙන් මිදීමේ අවශ්‍යතාවයක් නොතිබුණා සේම, බ්‍රිතාන්‍ය පාලනය යටතේ ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටීමේ ස්ථාවරයක සිටියාය යන්න ද ඒ තරමටම සත්‍යයක් විය. මෙම බෞද්ධාගමික හා ජාතික අනන්‍යතාව වෙනුවෙන් පෙනී සිටි බලවේගවල විරෝධය සමහර විට යොමු වූයේ ව්‍යවස්ථාදායක මණ්ඩලයේ සිටි සිංහල නියෝජිතයින් හට එරෙහිවය. එම විරෝධය බෞද්ධ ක්‍රිස්තියානි විරෝධයක මට්ටමට සමහර විට පිරිහී තිබිණි.

වෘත්තීයමය පැත්තෙන් කම්කරුවන්ගේ අයිතීන් වෙනුවෙන් කටයුතු කිරීමට මුලින්ම ඉදිරිපත් වූ පුද්ගලයා ලෙස ඉතිහාසයට එක් වූ අර්නස්ට් බුල්ජන්ස් මහතා ද බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය තුළ ක්‍රියාත්මකවූ පුද්ගලයකු විය. 1888 දී බ්‍රිතාන්‍යයේ අධ්‍යාපනය නිමකොට ලංකාවට පැමිණ බෞද්ධාගම වැළඳගත් බුලජන්ස් බෞද්ධ ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ මධ්‍යස්ථානය වූ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම සමඟ කටයුතු කළේය. ශ්‍රී ලංකාවේ ප්‍රථම වෘත්තීය සමිතිය වූ ලංකා මුද්‍රණ කම්කරු සංගමය ආරම්භ කිරීමට මුල් වූයේද බුල්ජන්ස් මහතායි. මෙම කටයුත්තේ දී දොස්තර ලිස්බෝ පින්තු ද බුල්ජන්ස් සමඟ එක්විය. 1893 මෙරට ලියාපදිංචි කරන ලද ප්‍රථම වෘත්තීය සංගමය ආරම්භ වන විට, රටේ ගුරු පරපුර තුළ වෘත්තීය සමිතිමය රාමුවක සංවිධාන ගත වීම දක්නට ලැබිණ.

ජාතිකවාදී, ආගමිකවාදී, අමද්‍යප හා වෘත්තීය සමිතිවාදී කොටස්වලට අමතරව විසිවන සියවසේ දෙවන දශකයේ ආරම්භ වූ තරුණ සමිති ව්‍යාපාරය ද වාමාංශික ව්‍යාපාරයේ ආරම්භය කෙරේ විශාල බලපෑමක් ඇති කරන ලදී. ඇන්ඩි පෙරුම්පනායගමිගේ නායකත්වයෙන් බිහි වූ යාපනයේ තරුණ සංගමය, තරුණ සංගම් ව්‍යාපාරයේ කැපී පෙනෙන අවස්ථාවක් විය. වාමාංශික බලවේගවල නවාතැන වූයේ දකුණු කොළඹ තරුණ සංගමයයි.

1893 මුද්‍රණ කම්කරු වර්ජනයෙන් පසුව හුදකලා එහෙත් කම්කරුවන්ට විශාල ආශ්වාදයක් ගෙන දුන් වර්ජන රාශියක් ඇති විය. 1896 දී ඇති වූ රෙදි අපුල්ලන්නන්ගේ වැඩ වර්ජනය, කරත්තකරුවන්ගේ වැඩ වර්ජනය ආදිය මෙම වකවානුව තුළ සිදු වූ වර්ජනයන් විය. මෙම වැඩ වර්ජනවල දී, බෞද්ධ පුනර්ජීවනය වෙනුවෙන් පෙනී සිටි අය මෙන්ම, ජාතිකවාදීහු ද ඉදිරිපත් වූහ. කම්කරු ආරවුල් ආගමික හා ජාතිකවාදී ව්‍යාපාර, අමද්‍යප ව්‍යාපාර යන සියල්ල බ්‍රිතාන්‍ය පාලනයට අභියෝග කරන ඒවා විය. බ්‍රිතාන්‍ය පාලනට වඩා වැඩි තර්ජනයක් කරන ලද කම්කරු පංතියේ සංවිධානාත්මක නායකයා වූ ගුණසිංහයන්ගේ ආගමනය සිදු වූයේ ද මෙම වකවානුවේ දීමය. සිද්ධිමය වශයෙන් සාකච්ඡා කරන්නේ නම් මෙම පසුබිම දීර්ඝ ලෙස සාකච්ඡා කළ හැකි වුවත්, මෙම ක්‍රියාදාමයන් රටේ දේශපාලනික පිබිදීම කෙරෙහි බලපෑවාය යන්න ප්‍රමාණවත් බව අපගේ විශ්වාසයයි. මෙම බලවේග පසුකාලීනව ලංකා ජාතික සංගමය තුළට ගොනු වීමත්, ජාතික නිදහස වෙනුවෙන් පෙනී සිටිමින් බ්‍රිතාන්‍ය පාලනයෙන් යම් යම් සහන ඉල්ලා සිටීමත් දිගින් දිගටම සිදුවිය. ලංකා ජාතික සංගමයේ නායකත්වය ගෙන සිටි මෙරට ධනපති හා රදල පිරිස් ජාතික ස්වාධීනත්වය වෙනුවට ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටීම නොරිස්සූ පිරිස් ද සිටි බව අවධාරණය කළ යුතු විය.

ලංකාවේ කම්කරු පන්තිය ස්වාධීන ව්‍යාපාරයක් ලෙස සටන්කාමීව ඉදිරියට ගිය අතර, එහි නායකයා ලෙස ගුණසිංහයන් විසින් විශාල කාර්‍යභාරයක් ඉටු කරන ලදී. බ්‍රිතාන්‍ය සමාජවාදියකු වූ රැම්සේ මැක්ඩොනල්ඩ්ගේ ආභාෂය ලබා සිටි ගුණසිංහ වෘත්තීය සමිති ව්‍යාපාරයට සමාන්තරව ලංකා කම්කරු පක්ෂය බිහි කරන ලදී. ගුණසිංහයන් විසින් නායකත්වය දුන් ජයග්‍රාහී වර්ජන විශාල ප්‍රමාණයක් පැවතිය ද පසුකාලීනව ඔහු තම සටන්කාමී ස්ථාවරයෙන් බැහැර වූ බව දැක ගන්නට ලැබිණ. ගුණසිංහගෙන් පසු වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ බලය තහවුරු කර ගන්නේ පසුකාලීනව ලංකා සමසමාජ පක්ෂය නොව නැගීමට මූලික වූ පිරිසයි. මෙම පිරිස ද ලංකා ජාතික සංගමය තුළම ක්‍රියාත්මක වූවෝ වූහ.

ජාතිකවාදී, ආගමිකවාදී, අමද්‍යප හා වෘත්තීය සමිතිවාදී කොටස්වලට අමතරව විසිවන සියවසේ දෙවන දශකයේ ආරම්භ වූ තරුණ සමිති ව්‍යාපාරය ද වාමාංශික ව්‍යාපාරයේ ආරම්භය කෙරේ විශාල බලපෑමක් ඇති කරන ලදී. ඇන්ඩි පෙරුම්පනායගම්ගේ නායකත්වයෙන් බිහි වූ යාපනයේ තරුණ සංගමය, තරුණ සංගම් ව්‍යාපාරයේ කැපී පෙනෙන අවස්ථාවක් විය. වාමාංශික බලවේගවල නවාතැන වූයේ දකුණු කොළඹ තරුණ සංගමයයි.

ලංකා ජාතික සංගමය තුළ එකතු වූ සිටි ධනපති හා රදළ කොටස් ජාතික ස්වාධීනත්වය වෙනුවෙන් ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටිද්දී ඒ වන විට වෘත්තීය සමිති ව්‍යාපාරය තුළත්, තරුණ සමිති ව්‍යාපාරය තුළත් සිය බලය තහවුරු කරගෙන සිටි, රැඩිකල් බලවේග පූර්ණ ජාතික නිදහස වෙනුවෙන් උද්ඝෝෂණවල නිතර වෙමින් සිටියහ. මෙම ව්‍යාපාරයේ මූලිකත්වය ගෙන සිටි පිරිස වූයේ මෙරට මධ්‍යම පන්තිකයින්ගේ තරුණ දරු පරම්පරාවය. බ්‍රිතාන්‍ය ඇතුළු බටහිර රටවල අධ්‍යාපනය ලැබූ මෙම පිරිස එම රටවල පැවති වාමාංශික හා කොමියුනිස්ට් ව්‍යාපාරවල ආභාසය ලැබූ අය වූහ. ලංකාවේ ප්‍රථම වාමාංශික පක්ෂය වන සමාජ සමානත්වය වෙනුවෙන් පෙනී සිටි ලංකා සමසමාජ පක්ෂය බිහි කරන ලද්දේ මෙම පිරිස විසිනි. අද වනවිට පැරණි වම යන වචනයෙන් හඳුන්වනු ලබන ලංකා සමසමාජ පක්ෂය පිළිබඳ කතාව බෙහෙවින් විවාදශීලී වන බවට සැකයක් නැතත් එයින් එය ලංකාවේ ප්‍රථම වමේ පක්ෂය යන කරුණට කිසිම අයුරක බලපෑමක් නොකරනු ඇත.

**හේමසිරි සූරියපටබැඳි**

---

"අනේ බලාපන් නාමලී. මාව රස්සාවෙන් අස්කළා. මම දැන් ජීවත් වෙන්නෙ කොහොමද?"

ජේම්ස් නාමලී ඉදිරියෙ බැගෑපත් වුණා. ජේම්ස්ගේ අඥෝනාව නාමලිගේ දෑස් කඳුලින් තෙත් කළා.

"හොඳයි, ආපහු රස්සාව අරන් දෙන්න මට පුළුවන් දෙයක් කරන්නම්කො"

නාමලී මුවින් නොබැණ, හිස දෙපැත්තට වනල ජේම්ස්ට දුන්නු පිළිතුරේ තිබුණෙ ඒ වගේ තේරුමක්.

"උඹ මොනව කරන්නද? මගෙ වැරද්දට, මම යනව හොඳ එකී" නාමලීගේ එල්ලා වැටෙන දිගු නහයට තට්ටුවක් දාපු ජේම්ස් ආපහු හැරුණ.

මෙතෙක් වෙලා අමාරුවෙන් හිරකරන් ඉඳපු කඳුළු ගංගාවක් වගේ නාමලීගේ දෙකොපොල් දිගේ වැහෙන්නට ගත්හ.

නාමලී තැන්නෙ වලව්වට ආවෙ මාස දහයෙදි විතර. එදා ඉඳන් ඇයව බලා කියා ගත්තෙ ජේම්ස්. වෙලාවට කන්න දෙන්න,

## අලි කෙළි

වෙලාවට නාන්න අරන් යන්න විතරක් නෙමෙයි හැම දෙයකදිම ජේම්ස් ඇට රැකවරණය දුන්න. නාමලීට උහුලගන්න බැරි තරම් බර වැඩ වැටුණහම ජේම්ස්, එච්චර වැඩ කරන්න බෑ කෙලීට මහන්සියි කියල වළව්වේ අප්පොලත් එක්ක රණ්ඩු වුණ වෙලාවලුත් තිබුණ. ඇත්තටම ජේම්ස් නාමලීට තමන්ගෙ දරුවකුට වගේ සැළකුව, පසුගිය අවුරුදු දහය පුරාම නාමලීත්, ජේම්සුත් අතර තිබුණේ පුදුම බැඳීමක්.

"මේ තමයි නාමලී. හොඳ ඇතින්න. අද ඉඳල මෙයාව හොඳට බලා ගන්න ඕන බණ්ඩාර" තැන්නෙ අප්පො අලුත් ගොව්වෙක්ව එක්කර ගෙන ඇවිත් නාමලීව පෙන්නුවා.

"අද ඉඳන් උඹව බලා ගන්නෙ බණ්ඩාර. දඟලිලි නැතිව හිටපන්" තැන්නෙ අප්පො නාමලීගෙ හොඬයට තට්ටුවක් දාලා බණ්ඩාරට අලුත් රාජකාරියක් පැවරුව.

තැන්නෙ අප්පොට ආපහු හැරෙන්න ලැබුණෙ නැහැ. ඉස්සරහට හොඬය කරකවල තැන්නෙ අප්පොව ළඟට ඇද ගත්ත.

කිසි දෙයක් තේරුම් ගන්න බැරිවුණු තැන්නෙ අප්පො මරලතෝනි දෙන්න පටන් ගත්ත. හැමදාම රස පළතුරු දීල සලකන තමන්ගේ ස්වාමියා වුණු තැන්නෙ අප්පොට නාමලී එදා ඉඳලම පුදුම ආදරයක් දැක්වුවෙ. තැන්නෙ අප්පොත් නාමලීට පුදුම ආදරයකින් හිටිය. විදුලියක් කොටනවවගේ හදිසියෙන් වුණු මේ විනැම්බැසියෙන් තැන්නෙ අප්පො තුෂ්ණිම්භූත වුණා.

හොඬයට හිරකරන් ළඟට ඇදල ගත්තත් නාමලී තැන්නෙ අප්පොට කිසිම කරදරයක් කළේ නැහැ. බුරුලට අල්ලගෙන කකුළට හිර කරගෙන රඳවා ගෙන හිටිය.

"අනේ මේ මොකද නාමලී මාව අතඇරපන්. අනේ මාව බේරගනිල්ල"

නාමලී දිහාවට බැගෑපත් වෙන ගමන් ම, ඒ වෙනකොටත් වටපිටාවට එකතුවෙලා හිටිය කට්ටියට ඇහෙන්න තැන්නෙ අප්පො විලාප තිබ්බ.

"මොනව හරි කරනව. තමුසෙ දන්න අලි මන්තර ඇතිනෙ..." තැන්නෙ අප්පොගෙ බිරිඳ තැන්නෙ කුමාරිහාමි අලුත් ගොව්ව බණ්ඩාරගෙ ඇඟට පැන්න. තැන්නෙ අප්පොගෙ දරුවො එක සද්දෙට විලාප තියනව. තැන්නෙ වළව්ව එකම යුද පිටියක් වෙලා.

අලුත් ගොව්ව බණ්ඩාර, හෙණ්ඩුවත් අරන් නාමලීගෙ දන්න හැම තිලයකට ඇන්න. වෙනදාට ජේම්ස්ගෙ එක හෙණ්ඩු පාරකින් කඳුළු කඩාහලන නාමලී මෙදා හෙණ්ඩු පාරවල් කොච්චර ඇන්නත් හෙළ වුණේවත් නැහැ.

"තමුසෙට ඕක කරන්න බැරිද? අපි පණිවිඩයක් යවල ජේම්ස්ව ගෙන්නගමුද?" තැන්නෙ කුමාරිහාමි විලාප තියන ගමන්ම ඇහැව්ව.

"හ්ම්... ඌ එහෙම ගෙන්නන්න එපා" මරණයෙ එළිපත්ත උඩ හිටියත් තැන්නෙ අප්පොගෙ ආඩම්බරය අඩුවෙලා නැහැ.

"ඕක පඩි මදි කියල මාත් එක්ක එකටෙක කිව්ව..." තැන්නෙ අප්පො නාමලීගෙ අත්අඬංගුවෙ ඉඳන් ම කෑගැහැව්ව.

තැන්නෙ අප්පො ජේම්ස්ව ගෙන්නන්න එපා කිව්වා විතරයි. නාමලී තැන්නෙ අප්පොව වෙලාන හිටිය බැම්ම තවත් දැඩි කළා.

"මෙන්න ආයෙත් මාව හිර කරනව. අනේ නාමලී මාව මරන්න එපා..." තැන්නෙ අප්පො ජීවිතය ඉල්ලල කෑගහන්න ගත්තා.

"මට නම් බෑ මේ සතාව මේච්චල් කරන්න..." අලුත් ගොව්ව බණ්ඩාර පැත්තකට වුණා.

"කෝ කෝ පැත්තකට වෙනව..." කාගෙදෝ පණිවිඩයකට ජේම්ස් ආයෙත් ඇවිත්. කට්ටිය දෙපැත්තට කරල ජේම්ස් නාමලී ළඟට කිට්ටු වුණා.

"හ්ම් අතඇරපන් අප්පොව..." ජේම්ස් හෙණ්ඩු පොලු මොනවත් නැතුව නාමලී ළඟට කිට්ටු වුණා. ජේම්ස්ව දැකපු ගමන් නාමලීගේ හැසිරීමේ මොකක්දෝ වෙනසක් වුණා. ඒත් ඇය අප්පොව අත හැරියෙ නැහැ.

ජේම්ස් දැකපු තැන්නෙ අප්පො අහක බලා ගත්ත. මේක දැකපු නාමලී ආයෙත් විලංගුව තද කළා.

"අනේ මෙන්න මාව ආයෙත් හිර කරනව. ජේම්ස් අනේ නාමලීට කියල මාව බේර ගනින්..." තැන්නෙ අප්පො උජාරුව පැත්තකට දාල ජේම්ස්ට පින්සෙණ්ඩු වුණා.

ජේම්ස් හීන්සීරුවෙ නාමලී ළඟට කිට්ටු වුණා. ඇගේ ඇඟට අත තිබ්බ විතරයි. නාමලී තැන්නෙ අප්පොව නිදහස් කළා. හොඬේ ජේම්ස්ගෙ සිරුර පුරා අතුල්ලමින් සතුටු වුණා. අවුරුදු ගණනක් තමන්ව බලාගත්තු ජේම්ස්ගෙ රස්සාව නැතිවුණු වෙලාවෙ, ඒක ආපහු අරන් දෙන්න නාමලී ගෙනගිය සටන ජයග්‍රහණය කළා.

අපේ රටේ හීලෑ අලින්ගෙ වතගොත අවුස්සද්දි මේ වගේ කතා බොහොමයක් මුණ ගැහෙනව. සබරගමුව ආශ්‍රිත වළව්වල මේ වගේ අලි කතා රාශියක් නිර්මාණය වෙලා තිබෙනව.